සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2016 ජූලි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2016-07-23
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්,* ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ* ***නොහැකි*** *ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න දහසය (16) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන් මූල්‍ය තත්ත්වයට අදාල මූලිකාංග ඇතුලත් වන්නේ කුමන කාණ්ඩයේ ද?

(1) වත්කම්, ස්කන්ධය සහ ආදායම්.
(2) වත්කම්, වගකීම් සහ වියදම්.
(3) වත්කම්, වගකීම් සහ ආදායම්.
(4) වත්කම්, වගකීම් සහ ස්කන්ධය. (ලකුණු 02)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන් පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක වාසියක් **නොවන්නේ** කුමක් ද?

(1) පද්ධතියේ වේගය වැඩියි.
(2) ජනනය කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය ඉතා ඉහළයි.
(3) එයට යාවත්කාලීන වාර්තා ජනනය කළ හැකිය.
(4) යෙදවුම් වැරදි වුවද එයට නිරවද්‍ය නිමැවුමක් ජනනය කළ හැකිය. (ලකුණු 02)

**1.3** බැරපතක් (Credit Note) යනු:

(1) ආපසු යවන ලද භාණ්ඩවල වටිනාකම අඩුකර ගැනුම්කරු විසින් විකුණුම්කරුට නිකුත් කරනු ලබන ලියවිල්ලකි.

(2) පෙර ඉන්වොයිසියක කොන්දේසි (terms) යටතේ, භාණ්ඩ ගැණුම්කරු විසින් විකුණුම්කරුට ගෙවීමට තිබූ ප්‍රමාණය අඩු කරමින්, භාණ්ඩ විකුණුම්කරුවෙකු විසින් ගැනුම්කරුට නිකුත් කරනු ලබන ලියවිල්ලකි.

(3) ගැනුම්කරුවෙකුගෙන් මුදල් ලැබෙන විට පිළියෙල කරනු ලබන ලියවිල්ලකි.

(4) විකුණුම්කරුවෙකුට ගෙවීම් කරන විට පිළියෙල කරනු ලබන ලියවිල්ලකි. (ලකුණු 02)

**1.4** අස්තිත්වයක එක් ගිණුම් කාල පරිච්ජේදයක මූල්‍ය ප්‍රකාශන තවත් ගිණුම් කාල පරිච්ජේදයක මූල්‍ය ප්‍රකාශන සමග සන්සන්දනය කිරීමට පහසුකම් සපයනු ලබන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ප්‍රමාණාත්මක බවේ (Materiality) සංකල්පයයි. (2) සංගතතා (Consistency) සංකල්පයයි.

(3) මූල්‍ය මිනුම් (Money Measurement) සංකල්පයයි. (4) උපචිත (Accrual) සංකල්පයයි. (ලකුණු 02)

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන් ප්‍රාථමික සටහන් පොතක් **නොවන්නේ** කුමක් ද?

(1) පොදු ලෙජරය. (2) මුදල් පොත.

(3) පොදු ජර්නලය. (4) දෛනික ගැනුම් පොත. (ලකුණු 02)

**1.6** පහත සඳහන් වැරදි අතුරෙන් ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් අනාවරණය කරගත හැකි වන්නේ කුමන වැරුද්ද ද?

(1) රු.45,000/- ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ගිණුම සහ වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුම යන දෙකේම දෙවතාවක් සටහන් කර තිබීම.

(2) අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික පරිභෝජනය සඳහා ගෙනයන ලද රු.12,500/- ක් වටිනා භාණ්ඩ ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මගහැරී තිබීම.

(3) රු.20,000/- ලද වට්ටම, දුන් වට්ටම් ගිණුමට හර කර තිබීම.

(4) රු.30,000/- ක ණය පොලිය, අයිරා පොලී ගිණුමේ සටහන් කර තිබීම. (ලකුණු 02)

**1.7** 2016 අප්‍රේල් මාසය සඳහා වෙළෙඳ ගෙවිය යුතු මුදල් සම්බන්ධව පහත සඳහන් තොරතුරු සමාගමක පොත්වලින් උපුටා ගන්නා ලදී:

| **විස්තරය** | **රු.** |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | 825,000 |
| මාසය තුළදී ගෙවූ මුදල් | 462,200 |
| ගැනුම් ආපසු යැවුම් | 75,000 |
| 2016 අප්‍රේල් 30 දිනට ශේෂය | 955,300 |

2016 අප්‍රේල් මාසය තුළදී සිදු කළ මුළු ණයට ගැනුම් වන්නේ:

(1) රු.517,500/- කි. (2) රු.667,500/- කි.

(3) රු.676,500/- කි. (4) රු.256,900/- කි. (ලකුණු 02)

*අංක 1.8 සිට 1.16 දක්වා ප්‍රශ්න වලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.8** පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශන (General Purpose Financial Statements) සම්බන්ධයෙන් මූලික ගුණාත්මක ලක්ෂණයක් ලෙස සලකනු ලබන "අදාලත්වය" (Relevance) යන්නෙහි තේරුම සඳහන් කරන්න. (ලකුණු 02)

**1.9** ව්‍යාපාරයක ඇල්මක් දක්වන පාර්ශවයන් (stakeholders) දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.10** "ස්කන්ධය" (Equity) යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 02)

**1.11** "ප්‍රමාණාත්මක බවේ (Materiality) සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

**1.12** පොදු ගිණුම්කරණ මෘදුකාංග පැකේජ (general accounting software packages) සඳහා උදාහරණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.13** **අනිල්**, ලිපිද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. පහත සඳහන් ගනුදෙනු ඔහුගේ ව්‍යාපාරයට අදාල වේ:

(i) **සීමාසහිත මියාමි බුක්ස් (පෞද්ගලික) සමාගමෙන්** රු.10,000/- ක ලිපිද්‍රව්‍ය ණය පදනම මත මිලට ගැනීම.

(ii) විකුණන ලද පොත් සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් රු.2,500/- ක චෙක්පතක් ලැබුණි.

(iii) **සීමාසහිත මියාමි බුක්ස් (පෞද්ගලික) සමාගමෙන්** මිලට ගත් රු.1,000/- ක ලිපිද්‍රව්‍ය, **අනිල්** ආපසු හරවා යවන ලදි.

ඉහත එක් එක් ගනුදෙනුව වාර්තා කිරීම සඳහා අදාල වන ප්‍රාථමික සටහන් පොත හඳුනා දක්වන්න. (ලකුණු 03)

**1.14** පහත සඳහන් එක් එක් වියදම "ප්‍රාග්ධන වියදම්" හෝ "අයහාර වියදම්" ලෙස වර්ගීකරණය කරන්න:

(i) මිලදී ගත් නව යන්ත්‍රය සඳහා දරණ ලද රු.100,000/- ක සවිකිරීමේ පිරිවැය.

(ii) ආරක්ෂක සේවකයන්ට කළ රු.10,000/- ක ගෙවීම.

(iii) රු.8,000/- ක විදුලි බිල ගෙවීම. (ලකුණු 03)

**1.15** *පහත සඳහන් එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න. සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

(i) සමාගමක් විසින් කරනු ලබන මුදලට විකුණුම්, දෛනික විකුණුම් පොතේ සටහන් කරනු ලබයි.

(ii) ගනුදෙනු වාර්තා කිරීමේදී, මුදල් පොත ප්‍රාථමික සටහන් පොතක් ලෙස මෙන්ම ලෙජර් ගිණුමක් ලෙස ද කටයුතු කරනු ලබයි.

(iii) වර්ෂය තුලදී ලියා හරින ලද බොල්ණය, පොදු ජර්නලයේ සටහන් කරනු ලබයි. (ලකුණු 03)

**1.16** පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන, සඳහන් කරන්න:

(i) **X සමාගම,** වෙළෙඳ ණයහිමියෙකු වන **උදානට** ගෙවිය යුතු රු.50,000/-, රු.3,750/- ක වට්ටමක් අඩුකිරීමෙන් පසු පියවන ලදි.

(ii) ව්‍යාපාරයේ අයිතිකරු, ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු.3,000/- ක මුදලක් ලබා ගත්තේය.

(iii) **Y සමාගම,** රු.750,000/- ක චෙක්පතක් නිකුත්කර රු.1,500,000/- ක් වටිනා මෝටර් රථයක් මිලදී ගත්තේය. ඉතිරි මුදල දින 30 ක් තුලදී ගෙවිය යුතු වේ. (ලකුණු 06)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

රැකියාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, **මංගල,** 2016 මැයි 01 වන දින රු.2,500,000/- ක් මුදලින් ආයෝජනය කර, විදුලි උපකරණ විකිණීම සඳහා **එම් සහ එම් ට්‍රේඩර්ස්** නමින් ව්‍යාපාරයක් අරඹන ලදී. 2016 මැයි මාසය තුළදී සිදුවූ ව්‍යාපාර ගනුදෙනු වල විස්තර පහත දැක්වේ:

| දිනය | විස්තරය |
|---|---|
| 2016.05.01 | ඔහු රු.720,000/- ක් වටිනා ඔහුගේ වෑන් රථය, භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා ව්‍යාපාරයට පවරා දෙන ලදී. |
| 2016.05.03 | මුදලින් රු.900,000/- ක් ගෙවා රු.1,200,000/- ක් වටිනා විදුලි උපකරණ මිලට ගත් අතර, ඉතිරි මුදල දින 60 ක් තුළදී ගෙවිය යුතුවේ. |
| 2016.05.10 | කාර්යාල ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.35,000/- ක් වන අතර, ගොඩනැගිල්ල පාවිච්චිය සඳහා මාස 6 ක කුලිය අත්තිකාරමක් ලෙස ගෙවන ලදී. |
| 2016.05.11 | 2016 මැයි මාසය සඳහා ගොඩනැගිල්ලේ කුලිය වන රු.35,000/- ක් ගෙවන ලදී. |
| 2016.05.26 | රු.623,000/- ක විදුලි උපකරණ මුදලට විකුණන ලදී. |
| 2016.05.30 | සුළු මුදල් අග්‍රිම ක්‍රමයක් පිහිටුවීම සඳහා, රු.25,000/- ක් සුළු මුදල් භාරකරුට දෙන ලදී. |
| 2016.05.31 | වාර්ෂිකව 10% ක පොළී අනුපාතිකයක් යටතේ රු.600,000/- ක ස්ථාවර තැන්පතුවක් අරඹන ලදී. |

අතිරේක තොරතුරු:

මෝටර් වාහන පිරිවැය මත 20% ක වාර්ෂික අනුපාතයක් යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන,

**ඔබ විසින් කළ යුතු දෑ,**

**එම් සහ එම් ට්‍රේඩර්ස්** හි 2016 මැයි 31 වන දිනට ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**PC ට්‍රේඩර්ස්** හි ගිණුම් සහායක විසින් සකස් කරන ලද, 2016 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව ලාභය රු.250,000/- කි.

පහත සඳහන් වැරදි පසුව හඳුනා ගන්නා ලදී:

(1) ව්‍යාපාරයේ හිමිකරු විසින් ඔහුගේ පුද්ගලික පරිහරණය සඳහා ලබාගත් භාණ්ඩවල පිරිවැය රු.62,500/- ක් වන අතර එය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(2) රු.112,400/- ක කුලී ආදායම, කුලී වියදම් ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(3) රු.32,500/- කට මුද්‍රණ යන්ත්‍රයක් මිලට ගැනීම, අළුත්වැඩියා සහ නඩත්තු ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(4) රු.298,000/- ක ණයට ගැනුම්, වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුමේ මෙන්ම ගැනුම් ගිණුමේ ද, රු.289,000/- ක් ලෙස සටහන් කර තිබුණි.

(5) රු.1,800/- ක සේවක සුබ සාධන වියදම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි. නමුත්, එය ප්‍රචාරණ වියදම් ගිණුමට හර කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත දෝෂ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 06)

(b) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද ලාභය දක්වන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු ටේප් නිෂ්පාදනය කිරීමේ නිරත සමාගමක් වන **සීමාසහිත ෆයින් ටේප්ස් සමාගමේ** 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

2015 අප්‍රේල් 01 දිනට සහ 2016 මාර්තු 31 වන දිනට පැවති තොග පහත පරිදි වේ:

| **තොග වර්ගය** | **2015 අප්‍රේල් 01 (රු.)** | **2016 මාර්තු 31 (රු.)** |
|---|---|---|
| අමුද්‍රව්‍ය - ටේප් රෝල් | 2,560,000 | 1,750,000 |
| නොනිමි වැඩ (මුළු නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 1,225,000 | 850,000 |

වර්ෂය තුලදී දරණ ලද වෙනත් වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| **විස්තරය** | **රු.** |
|---|---|
| අමුද්‍රව්‍ය මිලට ගැනීම් | 5,950,000 |
| ගෙන ඒමේ කුලී (අමුද්‍රව්‍ය) | 330,000 |
| ගොඩනැගිලි ක්ෂය | 650,000 |
| කම්හල් යන්ත්‍ර ක්ෂය | 1,875,000 |
| වේතන - යන්ත්‍ර ක්‍රියාකරුවන් | 4,278,000 |
| වැටුප - නිෂ්පාදන කළමනාකරු | 750,000 |
| වැටුප් - පරිපාලන සේවකයන් | 450,000 |
| විදුලි වියදම් | 1,380,000 |
| දුරකතන වියදම් | 120,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් $\frac{1}{10}$ ක් කාර්යාලය සඳහා භාවිත කරයි.

(2) 2016 මාර්තු මාසය සඳහා පහත සඳහන් උපචිත වියදම් ගිණුම් ගත කළ යුතුය:

| | **රු.** |
|---|---|
| නිෂ්පාදන කළමනාකරුගේ වැටුප | 65,000 |
| යන්ත්‍ර ක්‍රියාකරුවන්ට ප්‍රසාද දීමනා | 15,000 |

(3) පහත වියදම් දී ඇති අනුපාතයන්ට අනුව බෙදා වෙන් කළ යුතුය:

| **වියදම්** | **කම්හල** | **කාර්යාලය** |
|---|---|---|
| විදුලි වියදම් | 90% | 10% |
| දුරකතන වියදම් | 40% | 60% |

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ෆයින් ටේප්ස් සමාගමේ** නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**

(ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**හර්ෂණ,** ඔහුගේ පියාගේ උදව් ඇතිව 2016 අප්‍රේල් 01 වන දින ඔහුගේම ව්‍යාපාරයක් ඇරඹුවේය. 2016 අප්‍රේල් මාසය සඳහා ඔහුගේ ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදි:

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2016.04.01 | ඔහු ව්‍යාපාරය ආරම්භ කිරීමට මුදලින් රු.750,000/- ක් සහ නැවත විකිණීම සඳහා රු.325,000/- ක් වටිනා භාණ්ඩ හඳුන්වා දෙන ලදි. |
| 2016.04.03 | රු.75,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු.100,000/- කට මුදල් පදනම මත විකුණන ලදි. |
| 2016.04.15 | රු.200,000/- ක් පිරිවැය වූ භාණ්ඩ රු.250,000/- කට ණය පදනම මත විකුණන ලදි. |
| 2016.04.19 | ණය පදනම මත රු.525,000/- ක, භාණ්ඩ මිලට ගන්නා ලදි. |
| 2016.04.25 | ගනුදෙනුකරුවෙකුගෙන් රු.10,000/- ක් අයකර ගන්නා ලදි. |
| 2016.04.30 | මුදලින් රු.100,000/- ක් ගෙවා කාර්යාලයීය පාවිච්චිය සඳහා රු.250,000/- කට මෝටර් බයිසිකලයක් මිලට ගන්නා ලද අතර, ඉතිරිය මාස දෙකක් තුළදී පියවිය යුතු විය. |

**ඔබ විසින් කළ යුතු දෑ,**

(a) ඉහත සඳහන් එක් එක් ගනුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම් **සටහන් කරන්න**.

*(ස්ථාවර වත්කම් + තොග + ණයගැතියෝ + මුදල් = ප්‍රාග්ධනය + වගකීම්)* (ලකුණු 07)

(b) 2016 අප්‍රේල් 30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**ශාන්ත ටයර් ට්‍රේඩර්ස්** හි 2016 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහතින් දක්වා ඇත. **ශාන්ත ටයර් ට්‍රේඩර්ස්, ශාන්තට** අයිති තනි පුද්ගල ව්‍යාපාරයකි.

**2016 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ අගය, රු.1,500,000/-) | 12,000 | |
| මෝටර් වාහන | 7,500 | |
| ලීබඩු සහ සවිකිරීම් | 5,500 | |
| 2015 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 1,038 |
| මෝටර් වාහන | | 3,280 |
| ලීබඩු සහ සවිකිරීම් | | 2,200 |
| 2015 අප්‍රේල් 01 දිනට, තොගය | 3,500 | |
| ගැනිලි | 190 | |
| 2015 අප්‍රේල් 01 දිනට, අඩමාන ණය සඳහා වෙන් කිරීම | | 23 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ / වෙළෙඳ ගෙවිය යුතු දෑ | 4,333 | 2,662 |
| ගැනුම් / විකුණුම් | 35,000 | 54,500 |
| විදුලිය සහ ජල ගාස්තු | 1,045 | |
| වැටුප් සහ වේතන | 1,947 | |
| විකුණුම් කොමිස් | 930 | |
| ගෙන ඒමේ කුලී | 450 | |
| ලද වට්ටම් | | 35 |
| වරිපනම් | 537 | |
| ප්‍රචාරණ වියදම් | 2,590 | |
| 2015 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධනය | | 20,660 |
| 12% බැංකු ණය | | 4,500 |
| අතැ'ති මුදල් | 8,219 | |
| බැංකුවේ ඇති මුදල් | 5,157 | |
| | **88,898** | **88,898** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 මාර්තු 31 දිනට අවසන් තොගය රු.1,320,000/- කට අගය කර ඇත.

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත පහත පරිදි ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | - | වාර්ෂිකව 5% |
| මෝටර් වාහන | - | වාර්ෂිකව 20% |
| ලී බඩු සහ සවිකිරීම් | - | වාර්ෂිකව 25% |

(3) 2016 මාර්තු 31 දිනට **ලීනාගෙන්** ලැබිය යුතු වෙළෙඳ ශේෂයක් වන රු.33,000/-, බොල්ණය ලෙස ලියා හැරීමට තීරණය කරන ලද අතර, වර්ෂය අවසානයේ ඉතිරි වෙළෙඳ ලැබිය යුතු ශේෂය මත අඩමාන ණය සඳහා 5% ක පොදු වෙන් කිරීමක් කළ යුතුය.

(4) විකුණුම් මත 2% ක විකුණුම් කොමිස් මුදලක් විකුණුම්කරුවන්ට ගෙවිය යුතුය.

(5) 12% බැංකු ණය මුදල, 2016 මාර්තු 01 දින ලබා ගන්නා ලද අතර එය 2016 අප්‍රේල් 01 දින සිට පොලිය සමග සමාන මාසික වාරික 12 කින් පියවිය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |